# පක්ෂ ක්‍රමයෙන් අපි මිදෙන්න ඕනෑ

## මිලින්ද මොරගොඩ



'පරමාදර්ශී නගරයක් කරමු' යන තේමා පාඨය අනුව යමින්, කොළඹ නගරයට අහිමි වූ අභිමානය යළි ලබාදෙමින් කොළඹ පරමාදර්ශී නගරයක් බවට පත්කිරීමට ගන්නා මුල් පියවර වශයෙන් අභිනව මහ නගර සභාව පත්වී පළමු දින 100 ඇතුළත කඩිනම් වැඩසටහන් ක්‍රියාවට නංවන බව කොළඹ මහනගර සභාවේ එක්සත් ජනතා නිදහස් සන්ධාන නගරාධිපති අපේක්ෂක මිලින්ද මොරගොඩ මහතා පවසයි. හිටපු ඇමතිවරයකු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන මිලින්ද මොරගොඩ මහතා ඉරුරැස සමග සංවාද ගත වූයේ මෙසේය.

**ඔබ කොළඹ මහනගර සභාව සඳහා එක්සත් ජනතා නිදහස් සන්ධානයේ නගරාධිපති අපේක්ෂක ලෙස තරග වදිනවා. මැතිවරණය සඳහා ඔබගේ සැලසුම් මොනවාද?**

අපි කොළඹ නගරයේ ජනතාවට සැලැස්මක් ඉදිරිපත් කරල තියෙනවා. ඒ සැලැස්ම අපි දෙකට බෙදල තියෙනවා. දින 100 සැලැස්මක් අපි ඉදිරිපත් කර තියෙනවා. දින 100 ක් තුළ නගරයේ යම්කිසි පරිවර්තනයක් කරන්න. එහි මාතෘකා 12ක් යටතේ කරුණු ඉදිරිපත් කර තිබෙන අතර ඒ සඳහා ජනතාවට අදහස් දැක්වීමට අවස්ථාවක් දීල තියෙනවා. අපගේ ඡන්ද ව්‍යාපාරය නිරන්තරයෙන්ම ජනතාව සමග සංවාදශීලීව කටයුතු කරන්නේ. එම කරුණු 12 ඇතුළත් පත්‍රිකාව අපි ගෙයින් ගෙට බෙදනවා. ඊට අමතරව සම්පූර්ණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ රාමුවක් සකස් කරල තියෙනවා. එය වෙබ් අඩවියේ සහ දුරකථනයෙන් කථා කර ලබාගත හැකියි. මේ සඳහා ජනතාවගේ අදහස් අවශ්‍යයි. ඔබගේ පළාතේ ප්‍රශ්නයක් තියෙනවා නම්, එය අපගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට ඇතුළත් නොකරන්න පුළුවන්. එය සංවාදශීලී ආකාරයට ජනතා සහභාගීත්වයෙන් අපි මෙය නිර්මාණය කරනවා. ඒ අනුව ඡන්ද ව්‍යාපාරය අවසානයේදී ජනතා අදහස් එකතු කර ඉදිරිපත් කරනවා. ත්‍රිරෝද සංගම් වලින් ප්‍රශ්න තියෙනවා. මළ නාලිකා සම්බන්ධ ගැටලු තියෙනවා. මෙය තමයි අපේ දර්ශනය. නගර සභාව කියන්නේ සේවා සපයන ආයතනයක්. මෙය දේශපාලන පාපන්දුවක් නොවෙයි. එම සේවා සැපයීම දේශපාලන මුහුණුවරකින් නෙමෙයි සිදු වෙන්නේ. ඒ නිසා අපි ප්‍රතිපත්ති පිළිබඳව සාකච්ඡා කරමු. අපේ ප්‍රතිපත්ති අපි ඉදිරිපත් කරල තියෙනවා. ජනතාවට ඒ පිළිබඳව ප්‍රතිචාර දැක්වීමට අවස්ථාව දීල තියෙනවා. හැම දෙනාම ප්‍රතිපත්ති ඉදිරිපත් කරලා ජනතාව තීන්දුව ගනියි.

**කොළඹ නගරයෙන් පැල්පත්වාසී ජනතාව ඉවත් කිරීම මේ වන විට විවාදයට තුඩු දී තිබෙනවා. ඔබලා කියන්නේ එවැනි කටයුත්තක් සිදු නොවන බවයි. මෙය මැතිවරණ පොරොන්දුවක් පමණක්ද? මැතිවරණයෙන් පසුව කුමක් වෙයිද?**

ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 7 වැනි කරුණ පැහැදිලිවම ඒ බව සඳහන් වෙනවා. වතු ජීවිතය කියන එක මේ නගරයේ උරුමයක් කරන්න බැහැනේ. ඒක වැරදියි. දේශපාලන හේතු මත සමහරු වතු ජීවිතය උරුමය ලෙස තබා ගන්න හදනවා. රට සංවර්ධනය වන විට ජනතාව ඉහළ ජීවිතයකට එන්න ඕන. ඒ පරිවර්තනය සිදු වෙන්න ඕන. සෑම දෙනාගේම කටයුතු සිද්ධ වෙන්නේ නගරය තුළ. කොළඹින් පිට ගියොත් කොහොමද නගරයට සේවයක් වෙන්නේ. සෑම සමාජ පසුබිමකම අය නගරය තුළ ඉන්නවා. ආදර්ශමත් තට්ටු නිවාස කිහිපයක් හදලා ජනතාවට පෙන්වනවා මේක තමයි විකල්පය කියලා. ඒක කරන්නෙත් ආගමික නායකයෝ සමාජ නායකයෝ සමග කථා කරලා. තට්ටු නිවාස සම්බන්ධයෙන් එන ආකල්ප වෙනසක් කරන්න වෙනවා. ඉදිරියට තට්ටු නිවාස වලට තමයි යන්න වෙන්නේ. ඉදිරියේදී වතු සංස්කෘතිය සාර්ථක වෙන්නේ නැහැ. ඒ උරුමය ඊළඟ පරම්පරාවට දෙන එකත් සාධාරණ නැහැ. මෙය දේශපාලන පාපන්දුවක් කිරීමෙන් කරන්න හදන්නේ වතු වල ඉන්න ජනතාව ඒ ජීවන තත්ත්වයෙන්ම තියා ගෙන ඉන්න. ඒක නරකයි. ඊළඟ පරම්පරාවේ දරුවන්ට මෙයට වඩා හොඳ අනාගතයක් අපි ලබාදෙන්න ඕන. ඒක තමයි මෙතන තියෙන්නේ. මේ මට්ටමේම තියාගෙන වහල් බවට පත් කිරීම වැරදියි. මගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පැහැදිලිවම කරන්න ඕන මොකක්ද කියන එක සඳහන් වෙනවා.

**ඔබ හිටපු කැබිනට් ඇමැතිවරයෙක්. මේ අවස්ථාවේදී නගරාධිපති අපේක්ෂක ලෙස තරග කිරීමට අදහස් කළේ ඇයි?**

මට ජනාධිපතිතුමා ආරාධනාවක් කළා. මම ඒක ඉල්ලුවේ නැහැ. මම බොහෝ දුරට ඒ ගැන හිතුවා. කොළඹ මහනගර සභාවේ නගරාධිපති කියන්නේ මදිකමක් නෙමෙයි. එහි ඇති වගකීම් පිළිබඳව මම බොහෝ දුරට හිතුවා. මම කොළඹ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් ලෙස කැබිනට් මණ්ඩල රාශියක කටයුතු කළා. මේ මනාප ක්‍රමය අනුව කොළඹ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු ලෙස සමාජයට සෘජු සේවාවක් කිරීමට අපහසුයි. ආර්ථික ප්‍රතිසංස්කරණ ඇමැති, විද්‍යා හා තාක්ෂණ ඇමැති, සංචාරක ඇමැති, අධිකරණ ඇමැති ලෙස කටයුතු කළා. එහිදී ප්‍රතිපත්ති මට්ටමේ තමයි යම්කිසි දෙයක් කරන්න පුළුවන්. අද මොනව හරි කළොත් එහි ප්‍රතිඵල එන්නේ අවුරුදු ගණනකට පසු. ඒ වගේම මන්ත්‍රීවරයකු වන්නේ අවිස්සාවේල්ලේ සිට මට්ටක්කුලිය දක්වාම මන්ත්‍රී. සෘජු සේවයක් කරන්න අමාරුයි. මම බොහෝ ගැඹුරට හිතුවේ ඒ ගැනයි. මට කෙළින්ම සේවයක් කරන්න අවස්ථාවක් තියෙනවා. මට තිබූ අත්දැකීම් සහ සම්බන්ධතා සෘජු වෙනසක් කිරීම සඳහා මෙතනට පාවිච්චි කරන්න පුළුවන්. ජාත්‍යන්තර සම්බන්ධතා මෙතනට ආ විට ආධාර සම්බන්ධව බොහෝ කටයුතු කරන්න පුළුවන්. ජනතාවට දැනෙන දෙයක් කරන්න පුළුවන් අදහසින් තමයි මම මේ කටයුත්ත භාර ගත්තේ.

**ඔබගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දෙවැනි කරුණ ලෙස යහපාලනයෙන් සහ විනිවිද පෙනෙන ආකාරයේ මහනගර සභාවක් ඇති කරන බව කියනවා. නමුත් ඔබ සිදු කළ කටයුත්තක් සම්බන්ධයෙන් එවකට සන්ධානයේ ප්‍රවත්පතක් දූෂණ චෝදනා නගා තිබුණා. ඔබ කුමක්ද ඒ ගැන කියන්නේ?**

එය සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප කරනවා. මේවා දේශපාලන මඩ ගැසීම් ලෙස මම මුලින්ම කියනවා. ඔය චෝදනා සම්බන්ධව මම පාර්ලිමේන්තුවේදී උත්තරදීල තියෙනවා. දේශපාලනයේ නිතරම මඩ ගහනවා. මම පාර්ලිමේන්තුවේ ඉන්න කාලයේදී එය පැහැදිලි කරනවා. එම මඩ සම්පූර්ණයෙන් ම දේශපාලඥයෙක් ලෙස ප්‍රතික්ෂේප කරනවා. මේ චෝදනාව කරල තියෙන්නේ අවුරුදු 21 කට ඉස්සෙල්ලා සිද්ධ වුණ දෙයක් කියල කියන්න. ඒ කාලය තුළ එක්සත් ජාතික පක්ෂයේ ජාතික ලයිස්තු මන්ත්‍රීවරයෙක් ලෙස හිටියා. දෙවරක් ඡන්දය ඉල්ලුවා. කැබිනට් ඇමැතිවරයකු ලෙස හිටියා. මේ දේශපාලන විහිළු සාධාරණ නැහැ. මගේ මූලික න්‍යාය පත්‍රයෙන් ඈත් වෙන්නේ නැහැ. අපි කොළඹ නගරය ගැන කථා කරමු. බොරුවට මඩ ගහන්නේ නැතුව නගරය ගැන කථා කරමු. එක එක මඩ ගැහිලි යන විට ඒ ගැන මම වැඩිය අවධානය යොමු කරන්නේ නැත්තේ එය අපේ දේශපාලන සංස්කෘතිය නිසා. ඒවගේම මම අනුන්ට මඩ ගහන්නෙත් නැහැ.

**කොළඹ නගරයේ පෝස්ටර් ඇලවීම තහනම් කර තිබෙනවා. ඒක විපක්ෂයේ ඡන්ද ව්‍යාපාරය අඩපණ කිරීමේ සැලැසුමක් නොවෙයිද?**

ඔබ දන්නවා මම ඡන්දය පටන් ගත් දා සිට පෝස්ටර් ගැහුවේ නැහැ. ඒ කාලයේ මම විපක්ෂයේ හිටියේ.

**ඔබ ගැන නෙමෙයි මම විමසුවේ. කණ්ඩායමේ අපේක්ෂක පිරිසක්ම ඉන්නවා....?**

මෙහි නීතියක් තියෙනවා. මම පෝස්ටර් ගැහුවේ නැත්තේ නීතියට විරුද්ධ නිසා සහ පරිසරයට හානියක් නිසා. එය ජනතාවට කරන අගෞරවයක් ලෙස මම දකිනවා. නීතියක් තියෙනවා. නීතිය ක්‍රියාත්මක වෙනවා. මට උවමනාවට කරපු එකක් නෙමෙයි. පෝස්ටර් එකේ පැති කිහිපයක් තියෙනවා. පරිසර දූෂණය වෙන්න පුළුවන්, නීතියට විරුද්ධ වෙන්න පුළුවන්. ඊට අමතරව එය හරහා විශාල ගැටුම් ඇති වෙනවා. ඡන්ද ව්‍යාපාවල තරුණයෝ පෝස්ටර් ඇලවීමට ගොස් ඝාතනයවෙලා තියෙනවා. පෝස්ටරයකට මිනියක් මරණ එක සාධාරණද? පෝස්ටර්එක ලාභද? පෝස්ටරයක් ගහන්න කොච්චර සම්පත් යනවද? දැන් ගහන්නේ සාමාන්‍ය පෝස්ටර් නෙමෙයිනේ.

**ඉකුත් වර කොළඹ මහනගර සභා මැතිවරණය අවස්ථාවේදී එජාප නාමයෝජනා පත්‍රය ටිපෙක්ස් කිරීම සම්බන්ධයෙන් ඔබ දෙසට ඇඟිල්ල දිගු වුණා. එදා එවැනි පියවරක් ගත්තේ ඇයි?**

එයත් විහිළුවක්. ටිපෙක්ස් කිරීම ගැන මම දන්නේ නැහැ. සිරිසේන කූරේ මහතා තමයි ඉල්ලුවේ. එතුමාට තමයි එයින් අසාධාරණය සිද්ධ වුණේ. එතුමාගෙන් අහන්න පුළුවන් මොකක්ද සිද්ධ වුණේ කියල. ලයිස්තුවක් සකස් කිරීම අපේ වගකීමක් නෙමෙයි. පැහැදිලිව පක්ෂ යාන්ත්‍රණයෙන් වෙන එකක්. වයස අඩු තරුණයෙක් ලයිස්තුවේ හිටියා. ඒ නිසා ලයිස්තුව ප්‍රතික්ෂේප වුණා. එහි කථාව සිරිසේන කූරේ මහතාගෙන් අහන්න පුළුවන්. එතුමා තමයි අවසානයට මෙහි වන්දිය හෙව්වේ. දේශපාලන සටන් පාඨයෙන් මම අයින් වෙන්න කැමතියි. අපි කථා කරන්නේ කොළඹ නගරයේ පුරවැසියාගේ ජීවිතය ගැන. කොහොමද අපි අපේ නගරය හදා ගන්නේ කියන එක ගැන. දේශපාලන සටන් පාඨ කවුද මේක කළේ ඒක නෙමෙයි. කාටද මේ වැඩේ කරන්න පුළුවන්. එච්චරයි. අපි ප්‍රතිපත්ති ප්‍රකාශනයක් නිකුත් කරල තියෙනවා. ඒ ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව ජනතාවට තීන්දුවක් ගන්න පුළුවන්. සෑම අවස්ථාවේදීම දේශපාලන පාපන්දු ලෙස ක්‍රියා කරනවා. අවසානයේදී ජනතාව නොමග ගිහිල්ලා අසරණ වෙනවා. මම කියන්නේ ප්‍රතිපත්තිය බලන්න. මෙය හොඳ නැත්නම් ප්‍රශ්නයක් නැහැ.

**මෙහි නීතියක් තියෙනවා. මම පෝස්ටර් ගැහුවේ නැත්තේ නීතියට විරුද්ධ නිසා සහ පරිසරයට හානියක් නිසා. එය ජනතාවට කරන අගෞරවයක් ලෙස මම දකිනවා. නීතියක් තියෙනවා. නීතිය ක්‍රියාත්මක වෙනවා. මට උවමනාවට කරපු එකක් නෙමෙයි. පෝස්ටර් එකේ පැති කිහිපයක් තියෙනවා. පරිසර දූෂණය වෙන්න පුළුවන්, නීතියට විරුද්ධ වෙන්න පුළුවන්.**

16 පිටුවට